# අන්තර් කලායතන තරගාවලිය - 2019 (නර්තන අංශය)

සංස්කෘතික, අභ්‍යන්තර කටයුතු හා ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍යාංශය, සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා කලා මණ්ඩලය සහ රාජ්‍ය නර්තන හා මුද්‍රා නාට්‍ය උපදේශක සභාව, එක්ව සංවිධානය කරනු ලබන **"අන්තර් කලායතන තරගාවලිය- 2019 (නර්තන අංශය) "** සඳහා අයදුම්පත් භාරගනු ලැබේ.

■ අරමුණ

ශ්‍රී ලාංකේය නර්තන කලාවන්ගේ ප්‍රවර්ධනය උදෙසා එකී කලාවෙහි නියුක්ත කලායතනන නියෝජනය කරන කලා ශිල්පීන් හා ශිල්පිනියන් දිරිගැන්වීම, ඔවුන්ගේ කලා නිර්මාණ එළිදැක්වීමට අවස්ථා සම්පාදනය කිරීම සහ අගය කිරීම.

## (01) අයදුම් කිරීම

මේ සමග අමුණා ඇති ආදර්ශ අයදුම්පතට අනුව සකස් කරගත් අයදුම්පත් **2019 ජනවාරි මස 10 වෙනි දිනට** ප්‍රථම තමන් ස්ථිර පදිංචි කොට්ඨාසයට අදාළ ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ හෝ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සංස්කෘතික නිලධාරී වෙත භාර දිය යුතුය. අයදුම්පත බහාලන කවරයේ වම්පස ඉහළ කෙලවරේ **"අන්තර් කලායතන තරගාවලිය - 2019 (නර්තන අංශය) "** යනුවෙන් සඳහන් කළ යුතුය.

## (02) තරග පැවැත්වීම

I. පළමු වටයේ තරග - එක් එක් ශීර්ෂ සඳහා ලැබෙන අයදුම්පත් සංඛ්‍යාව අනුව දිස්ත්‍රික් මට්ටමින් තරග පවත්වනු ලැබේ.

II. අවසාන වටයේ තරග - දිස්ත්‍රික් මට්ටමින් ප්‍රථම ස්ථානය ලබාගත් නර්තන කණ්ඩායම් පමණක් ජාතික තරගයට කැඳවනු ලැබේ.

III. දිස්ත්‍රික් මට්ටමින් ප්‍රථම ස්ථානය ලබා ගත්ත ද, අපේක්ෂිත ප්‍රමිති මට්ටමට නොමැති නර්තන අංග ජාතික මට්ටමේ තරගය සඳහා නිර්දේශ නොකෙරේ.

## (03) තරග කාලසටහන

I. දිස්ත්‍රික් තරගාවලිය / පළාත් තරගාවලිය 2019 පෙබරවාරි මාසයේ දී පැවැත්වේ.
II. ජාතික තරගාවලිය 2019 අප්‍රේල්/මැයි මාසවල දී කොළඹ දී පැවැත්වේ.
III. ත්‍යාග ප්‍රදානෝත්සවය 2019 ජුනි මස කොළඹ දී පවත්වනු ලැබේ.

## (04) තරග කොන්දේසි

I. සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කලායතන සඳහා පමණක් මෙම තරගාවලිය සඳහා ඉදිරිපත් විය හැකිය.

II. එක් එක් තරග අංක සඳහා වෙන් වෙන් වශයෙන් අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය. (අපැහැදිලි සහ අසම්පූර්ණ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.)

III. දිස්ත්‍රික් තරගය සඳහා ඉදිරිපත් කරන ශිල්පීය නාම ලේඛනය අවසන් වටයේ දී වෙනස් කළ නොහැකිය. පිළිගත හැකි සාධාරණ හේතුවක් මත කිසියම් වෙනසක් කිරීමට අවශ්‍ය වන්නේ නම්, ඒ සඳහා සංස්කෘතික අධ්‍යක්ෂ විසින් බලය පවරන ලද නිලධාරියෙකුගේ පූර්ව අනුමැතිය තරග අවස්ථාවට ප්‍රථම ලබාගත යුතුය.

## (05) **පොදු කොන්දේසි**

I. සමූහ නර්තන සඳහා සහභාගී විය හැකි සංඛ්‍යාව අවමය 08 දෙනෙකි, උපරිම සංඛ්‍යාව 16 දෙනෙකි.

II. මිශ්‍ර නර්තන අංගයකදී ගැහැණු / පිරිමි සංඛ්‍යාව සමාන වීම අනිවාර්ය නොවේ.

III. ගැමි නාටක / නාට්‍යමය අවස්ථා සඳහා මෙහි දක්වා ඇති අවම සහභාගීත්ව සංඛ්‍යාව අදාළ නොවේ.

IV. සමූහ / ඒකල නර්තන අංගයක දී ගායන/ වාදන සඳහා යොදා ගත හැකි උපරිම සංඛ්‍යාව 08 දෙනෙකි.

V. **ඒකල වාදනයක දී ප්‍රධාන ශිල්පියා සමඟ** යොදා ගත හැකි උපරිම සංඛ්‍යාව 05 දෙනෙකි.

VI. සමූහ වාදනයක දී සහභාගී විය හැකි අවම සංඛ්‍යාව 08 දෙනෙකි. උපරිම සංඛ්‍යාව 16 දෙනෙකි.

VII. එක් කලායතනයකින් සහභාගී විය හැකි තරග අංශ සංඛ්‍යාව උපරිම 03 කි. (ඒකල 01 - සමූහ 02)

VIII. පළමු වටයේ දී පටිගත කළ සංගීතය යොදා ගැනීමට නියමිත අංග සඳහා අවශ්‍ය තාක්ෂණික උපකරණ (CD Player) තමන් විසින් සපයා ගත යුතුය.

IX. එක් කලායතනාධිපතිවරයෙකුට නර්තන අංග ඉදිරිපත් කළ හැක්කේ එක් කලායතනයකින් පමණි.

X. එක් තරගකරුවෙකුට ඉදිරිපත් විය හැක්කේ එක් කලායතනයකින් පමණි.

XI. පළමු වටයේ සහ අවසන් වටයේ තරග සඳහා ඉදිරිපත් වන සියලුම තරගකරුවන් සහ සහය ගායන හා වාදන ශිල්පීන් උචිත රංග වස්ත්‍රාභරණයෙන් සැරසී සිටිය යුතුය.

XII. තරග අංග සඳහා කාලය.

- ✓ ඒකල/ සමූහ/ නිර්මාණාත්මක නර්තන අංග සඳහා කාලය
  (අවමය විනාඩි 04 - උපරිමය විනාඩි 06)
- ✓ ඒකල වාදන (අවමය විනාඩි 04 - උපරිමය විනාඩි 06)
- ✓ සමූහ වාදන සඳහා කාලය (අවමය විනාඩි 05 - උපරිමය විනාඩි 07)
- ✓ ගැමි නාටක / නාට්‍යමය අවස්ථා සඳහා කාලය උපරිමය විනාඩි 10 යි.

(චක්‍රලේඛයෙන් දක්වා ඇති කාලසීමාවන් ඉක්මවා යන අංග තරගයෙන් ඉවත් කෙරේ)

XIII. තරගය සඳහා ඉදිරිපත් වන අයදුම්කරුවන්ගේ වයස් සීමාව 2018දෙසැම්බර් මස 31 වෙනි දිනට සම්පූර්ණ වී තිබිය යුතුය. (වයස් සීමාව සනාථ කිරීම සඳහා ජාතික හැඳුනුම්පත හෝ උප්පැන්න සහතිකය හෝ විදේශ ගමන් බලපත්‍රය තරගය පැවැත්වෙන දිනයේ දී ඉදිරිපත් කළ යුතුය)

XIV. ඉහත සඳහන් තරග කොන්දේසි උල්ලංඝනය කරන කණ්ඩායම/ කණ්ඩායම් තරගයෙන් ඉවත් කෙරේ.

XV. ජාතික තරගය සඳහා විදුලි ආලෝකය, ශබ්ද විකාශන පහසුකම් සපයනු ලැබේ.

XVI. විනිශ්චය මණ්ඩලයේ තීරණය අවසාන තීරණය වේ.

## (06) **ජයග්‍රාහකයින් ඇගයීම**

අන්තර් කලායතන තරගාවලියෙහි නර්තන අංශයෙහි ප්‍රථම, දෙවන හා තෙවන ස්ථාන සඳහා මුල්‍ය ත්‍යාග සහ සහතිකපත්‍ර ද ප්‍රථම ස්ථානය සඳහා පමණක් සම්මාන, තිළිණ ප්‍රදානය ද සිදු කරන අතර 2019 ජූනි මස 21 වෙනි දින කොළඹ නෙළුම්පොකුණ රඟහලේ දී සම්මාන උළෙළ පවත්වනු ලැබේ.